# 8 යුරෝපා ජාතීන්ගේ බල ව්‍යාප්තිය

**මෙම ඒකකයෙන් යුරෝපීයයන් යටත් විජිත පිහිටුවා ගැනීම හා ආගම් ප්‍රචාරය කළ ආකාරයත් සාකච්ඡා කෙරේ**

මෙහි දී අපි මුලින් ම යුරෝපීයයන් මුහුදු යාත්‍රික ගවේෂණවලට යොමුවීමට බලපෑ හේතු විමසා බලමු. ක්‍රි.ව. 1453 දී නැගෙනහිර රෝම අධිරාජ්‍යයේ අගනුවර වූ කොන්ස්තන්තිනෝපලය තුර්කි ඔටෝමාන්වරුන්ගේ මුස්ලිම් අධිරාජ්‍යයට යටත් විය. කොන්ස්තන්තිනෝපලය මේ වන විට වැදගත් වූයේ එය පෙර අපර දෙදිග වෙළෙඳ සම්බන්ධතා ගොඩනංවන ප්‍රධාන වෙළෙඳ මධ්‍යස්ථානය වූ බැවිනි.

15 වන සියවස වන විට යුරෝපය මධ්‍යතන යුගයෙන් නූතන යුගයට අවතීර්ණ වීමේ දී, සමාජ, ආර්ථික දේශපාලන හා සංස්කෘතික ක්ෂේත්‍රවල ඇති වූ වෙනස් වීම් සමග අනුක්‍රමයෙන් එහි ජාතික රාජ්‍යය බිහිවුනි. එසේ මුලින් බිහි වූ ජාතික රාජ්‍ය අතර එංගලන්තය, ස්පාඤ්ඤය, ප්‍රංශය හා ඕලන්දය යන රටවල් සඳහන් කළ හැකි ය. ජාතික රාජ්‍යයන් තම ශක්තිය හා බලය ව්‍යාප්ත කර ගැනීමට මුහුදු යාත්‍රික ගමන් සඳහා අනුග්‍රහය දක්වී ය.

නාවුක ගමනාගමනවල යෙදෙන්නන්ට පෘතුගාලයේ හෙන්රි රජතුමාගෙන් ලද සහාය නිසා ඔහු නාවික හෙන්රි යනුවෙන් හඳුන්වනු ලැබේ. ඔහුගෙන් සිදු වූ සේවාවන් මෙසේ ය.

- මුහුදු යාත්‍රික ගවේෂණය සඳහා අවශ්‍ය නැව් තනාදීම
- මුහුදු යාත්‍රික ගවේෂණ සඳහා අවශ්‍ය වෙනත් ආධාර දීම
- ශාන්ත වින්සන්ට් තුඩුව අසල ආකාශ වස්තු පරීක්ෂණාගාරයක් ඉදි කරවීම සහ පවත්වාගෙන යාමට ආධාර දීම

16 වන සියවසේ සිට යුරෝපය තුළ ඇති වූ ආගමික ගැටුම් ද එක්තරා අයුරකින් යුරෝපා බල ව්‍යාප්තියට පසුබිම් විය. ක්‍රිස්තියානි සභාව කතෝලික හා රෙපරමාදු වශයෙන් වෙන් වීමට පටන් ගත්තේ ය. මෙම තත්ත්වය යටතේ ඇති වූ ආගමික උද්යෝගය යුරෝපා බල ව්‍යාප්ත කටයුතුවල ද දක්නට ලැබේ.

යුරෝපයේ ඇති වූ පුනරුදය හා ආශ්‍රිත ව සිදු වූ විද්‍යාත්මක පෙරළිය දේශ ගවේෂණය සඳහා රුකුලක් විය. තාරකා විද්‍යාව පිළිබඳ වර්ධනය, දුරදක්නය, සොයා ගැනීම, සූර්ය කේන්ද්‍රීයබව පෘථිවියේ ගෝලාකාරබව ආදී සොයා ගැනීම් දේශ ගවේෂණ කටයුතුවලට බලපා ඇත.

මේ අනුව ජාතික රාජ්‍ය බිහිවීම, වෙළෙඳාම හා ආගම විද්‍යාත්මක සොයා ගැනීම් ආදිය යුරෝපා බල ව්‍යාප්තියට පසුබිම් වූ ප්‍රධාන සාධක විය.

## ස්පාඤ්ඤය

යුරෝපා ජාතීන් අතරින් දේශ ගවේෂණ කටයුතු සඳහා ප්‍රථමයෙන් ම එක් වූයේ ස්පාඤ්ඤය හා පෘතුගාලය යන රාජ්‍යයන්ය. ස්පාඤ්ඤ ජාතිකයෝ අත්ලන්තික් සාගරය ඔස්සේ බටහිර දිසාවට යාත්‍රා කරමින් මධ්‍යම හා දකුණු ඇමරිකාවේ ප්‍රදේශ කිහිපයක් සොයා ගත් හ. ක්‍රි.ව. 1492 දී ක්‍රිස්ටෝපර් කොළොම්බස් විසින් බටහිර ඉන්දීය දූපත් සොයා ගන්නා ලදී. ඒ සඳහා ස්පාඤ්ඤ රජුගේ අනුග්‍රහය ලැබී ඇත.



රූපය 8.1 - ක්‍රිස්ටෝපර්ගේ නැව

ෆර්නැන්ඩෝ කෝර්ටීස් විසින් ක්‍රි.ව. 1519 දී ඇස්ටෙක්ස් රාජධානිය විනාශ කරමින් මැක්සිකෝව අල්ලා ගැනීම ස්පාඤ්ඤ බල ව්‍යාප්තියේ තවත් එක් පියවරක් විය. රජුගේ අනුග්‍රහය මත ෆැන්සිස්කෝ පිසරෝ විසින් පීරූ ප්‍රදේශය යටත් කර ගැනීමෙන් ස්පාඤ්ඤ බල ව්‍යාප්තිය තව දුරටත් වර්ධනය වී ඇත.

යටත් විජිත පිහිටුවා ගැනීමේ දී යුරෝපා ජාතීන් අතර වූ බල අරගලය නිසා ක්‍රි.ව. 1493 පාප් වහන්සේගේ තීරණයක් අනුව දේශ ගවේෂණ කටයුතු සඳහා ස්පාඤ්ඤය හා පෘතුගාලය අතර කලාප බෙදා වෙන් කරන ලදී. මෙම බෙදීම කේප්වර්ඩ් දූපතට ලීග 370ක් බටහිරින් උතුරේ සිට දකුණට දිවෙන රේඛාවක් මගින් සිදුකරන ලදී. මේ අනුව පෘතුගීසීහු පෙරදිග හා ඉන්දියන් සාගර ප්‍රදේශවලත් ස්පාඤ්ඤයෝ ඇමරිකා මහාද්වීපවලත් සිය කටයුතු කරගෙන ගියහ.


රූපය 8.2 - වස්කෝ ද ගාමා

යටත් විජිතවල ක්‍රියාකාරිත්වයේ දී ස්පාඤ්ඤ ජාතිකයින් සෙසු යුරෝපා ජාතීන්ට වඩා වෙනස් ප්‍රතිපත්තියක් අනුගමනය කළ බව පෙනී යයි. ඔවුන්ගේ අපේක්ෂාව වූයේ තම යටත් ප්‍රදේශවලින් වෙළඳ ලාභ ලබා ගැනීම පමණක් නොව ප්‍රදේශ ආක්‍රමණය කර එහි ආධිපත්‍යය පිහිටුවා වටිනා සම්පත් තම මව් රටට රැගෙන යාමයි. රන්, රිදී වැනි වටිනා සම්පත්වලින් පිරි ඇමරිකාවෙන් ඒවා ආක්‍රමණ මගින් ලබාගෙන විශාල ධනස්කන්ධයක් තම මව් රටට යැවී ය.

මෙම අධිපත්‍ය ගොඩනගාගැනීමේ දී ස්පාඤ්ඤවරුන් ඉතා කෲර ලෙසත්, බිහිසුණු ලෙසත් අවි බලය යොදමින් ක්‍රියාකර ඇත. ඇමරිකාවේ සමහර ප්‍රදේශ යටත්කර ගැනීම පහසු වුවත් මෙක්සිකෝව හා පීරූ වැනි උසස් මට්ටමේ ශිෂ්ටාචාර ගොඩනැගී තිබූ ප්‍රදේශ ද විය. ස්පාඤ්ඤවරුන් විසින් මෙම ශිෂ්ටාචාර සම්පූර්ණයෙන් ම විනාශ මුඛයට ඇද දමන ලදී. පසු ව පැමිණි ධර්මදූතවරුන්, ආක්‍රමණිකයින්ගෙන් පීඩාවට පත් ජනතාව උදෙසා කළ සේවාවෙන් පැහැදුණු ජනතාවෝ ස්ව කැමැත්තෙන් කතෝලික ආගම වැළඳගත්හ. මේ නිසා යටත් ප්‍රදේශවල කතෝලික දහම ව්‍යාප්ත විය.

ස්පාඤ්ඤයන් යුරෝපයේ ඉතාලිය හා නෙදර්ලන්තය යන රටවල ඇතැම් ප්‍රදේශ තම ආධිපත්‍යයට නතුකර ගෙන තිබුණි.

දහහත්වන සියවස වන විට යුරෝපයේ බල තුලනය ඕලන්දය, ප්‍රංශය හා එංගලන්තය යන රටවල වාසිවන සේ වෙනස් වීමෙන් ස්පාඤ්ඤ ආධිපත්‍යයේ පිරිහීම සිදු විය.

## පෘතුගාලය

පාප් වහන්සේගේ සීමා අනුව පෘතුගාලය වැඩි වශයෙන් ම අවධානය යොමු කළේ ඉන්දියන් සාගරය අවට පිහිටි පෙරදිග රටවල් වෙතයි. ඒ අනුව ක්‍රි.ව. 1498 දී වස්කෝ ද ගාමා ඉන්දියාවේ බටහිර වෙරළේ පිහිටි කැලිකට් නගරයට පැමිණ ඇත. ඔහු කැලිකට් නගරයට පැමිණ ඇත්තේ බර්තොලමියු ඩයස් විසින් සොයාගන්නා ලද කුණාටු තුඩුව (සුභ පැතීමේ තුඩුව) හරහා ගමන් කිරීමෙනි. පෘතුගීසින් සොකොත්‍රා, ඕමුස්, ගෝව හා මලක්කා වැනි ප්‍රදේශ තම ආධිපත්‍යයට නතුකර ගනිමින් ඉන්දියන් සාගර කලාපයේ වෙළඳාම පාලනය කිරීමට උත්සාහ දරා ඇත.

පෘතුගීසීන් විසින් තම ග්‍රහණයට නතු වූ බල මූලස්ථානවල වෙළෙඳ ගබඩා සහ බලකොටු පිහිටුවා නාවුක බලය උපයෝගී කරගනිමින් ඉන්දියන් සාගරය තුළ හා අවට වෙළඳ කටයුතු පාලනය කරන ලදී.

ඔවුන් වෙළඳ කටයුතුවල දී ඉන්දියාව ඇතුළු පෙරදිග රටවලින් ඇත්දත් කුළු බඩු හා මැණික් ආදිය සපයා ගෙන ඒවා යුරෝපයට ගෙන යන ලදී. මෙම කටයුතුවල දී පෘතුග්‍රීසීහු ප්‍රාදේශීය පාලකයන් සමග මිත්‍රශීලී ලෙස ඇතිකරගත් ගිවිසුම් මගින් හා ඇතැම් විට අවි ගැටුම්වලින් ද සිය අවශ්‍යතා ඉටුකර ගත්හ.

පෘතුගීසීන්ට ඉන්දියාව තුළ භෞමික ආධිපත්‍යයක් ඇති කර ගැනීමට හැකි වූයේ ඉතා ම අල්ප වශයෙනි. ඔවුහු ශ්‍රී ලංකාවේ කෝට්ටේ රාජධානිය සමග ගිවිසුම් ඇති කර ගනිමින් ද, පහතරට වෙනත් ප්‍රදේශවල සිය අවි බලය මෙහෙයවමින් ද වෙළෙඳම මෙන් ම සිය ආධිපත්‍යය ද ගොඩනගා ගත්හ.

## ඕලන්දය

දහත්වන සියවන වන විට ඕලන්දය යුරෝපයේ බලවත් රාජ්‍යයක් ලෙස නැගී එමින් තිබුණි. ඕලන්දවරු (ලන්දේසීන්) ප්‍රධාන වශයෙන් පෙරදිග හා ඉන්දියන් සාගරය අවට ප්‍රදේශවල වෙළෙඳ හා බල මූලස්ථාන පිහිටුවා ගත්හ. ඔවුහු සිය ආධිපත්‍ය පිහිටුවීමේ දී ඇතැම් ස්වදේශික පාලකයන්ගේ සහයෝගය හා ආධාර ගනිමින් ක්‍රියා කළෝය. එසේ ම සමහර අවස්ථාවල දී ස්වදේශිකයන් සමග ගැටුම් ද ඇති කර ගත්තෝය.

ක්‍රි.ව. 1602 දී ඕලන්දයන් විසින් ඕලන්ද නැගෙනහිර ඉන්දියා වෙළෙඳ සමාගම පිහිටුවා ගන්නා ලදී. ඒ අනුව ඔවුන්ගේ අවධානය නැගෙනහිර ඉන්දීය දූපත් වූ, සුමාත්‍රා සහ බෝර්නියෝ වෙත යොමුවිය. බතාවිය ඔවුන්ගේ පෙරදිග බල මූලස්ථානය බවට ද පත් විය. මේ ප්‍රදේශවල තරමක භෞමික ආධිපත්‍යයක් ඕලන්දයන් සතු විය.

ඔවුන් ඉන්දියාවේ මුරුසි දිවයිනේ හා අප්‍රිකාවේ සුභ පැතීමේ තුඩුව ප්‍රදේශයේත් වෙළෙඳ මධ්‍යස්ථාන පිහිටුවාගෙන තිබුණි.

ඕලන්ද ජාතිකයින් විසින් උතුරු ඇමරිකාවේ ඇතැම් ප්‍රදේශවල සහ බටහිර ඉන්දීය දූපත්වල ද වෙළඳ කටයුතු කරගෙන යන ලදී. උතුරු ඇමරිකාවේ නව නෙදර්ලන්ත ජනපදය ද පිහිටුවා ගන්නා ලද්දේ ඕලන්ද ජාතීන් විසිනි. එහි අගනුවර නිව්ඇම්ස්ටර්ඩෑම් වර්තමානයේ නිව්යොර්ක් නමින් හැඳින්වේ.

දහත්වන සියවසේ දෙවන භාගය වන විට ඕලන්දය අභිභවා ප්‍රංශය හා එංගලන්තය නැගී ඒම දක්නට ලැබේ. ඒ අනුව ලන්දේසි බල ව්‍යාප්තිය සීමා විය.

## එංගලන්තය

දහත්වන සියවස වන විට ඉංග්‍රීසි ද සිය වෙළඳාම් හා ජනපද පිහිටුවීමේ කටයුතු සිදු කරමින් තිබිණි. ඔවුහු ඉන්දියාවේ වෙළඳ මධ්‍යස්ථාන කිහිපයක් පිහිටුවා ගත්හ. වර්ජිනියා, නිව් ඉංග්ලන්ඩ්, ටේරිලන්ඩ් කැරොලිනා. නිව්යෝර්ක්, නිව්ජර්සි, ඩෙලර්වෙයාර්, ඉංග්‍රීසින් විසින් උතුරු ඇමරිකාවේ පිහිටුවා ගන්නා ලද ජනපද වේ.

දහත්වන සියවස දෙවන භාගය වන විට එංගලන්තය, ඕලන්දයන්ගේ වෙළඳ අධිකාරිය බිඳ හෙළීමට ක්‍රියා කළේ ය. එංගලන්තයේ නාවුක පනත් සම්මත කර ඕලන්දය වෙළෙඳාමෙන් ලබන වාසි වැළැක්වීමට පියවර ගන්නා ලදී. ඉංග්‍රීසීන් ඉන්දියාවේ සහ ලංකාවේ ද සිය ආධිපත්‍ය පිහිටුවා ගන්නා ලදී. යුරෝපා බල ව්‍යාප්තියේ දී ඉන්දියාවේ සහ ඇමරිකාවේ භෞමික ආධිපත්‍යයක් ගොඩනගාගැනීම සඳහා ප්‍රංශය හා ඉංග්‍රීසින් අතර බල තරගයක් ඇති වුන අතර ඉන් ප්‍රංශය අභිභවා යාමට ඉංග්‍රීසීන්ට හැකි විය.

### ප්‍රංශය

ප්‍රංශ ජාතිකයෝ උතුරු ඇමරිකාවේ දහත්වන සියවස ආරම්භයේ දී පටන් ගවේෂණ කටයුතුවල හා ජනපද පිහිටුවීමේ නියුක්ත වූහ. ඉන් එක් ජනපදයක් කැනඩාවේ පිහිටුවන ලදී. චැම්ප්ලේන් නම් ප්‍රංශ දේශ ගවේශකයා පංච මහා විල් ඔස්සේ උතුරු ඇමරිකාවේ අභ්‍යන්තරයට පිවිසියේ ය. මෙහි දී ප්‍රංශ ජාතිකයෝ වෙළෙඳ හා බල ව්‍යාප්ති කටයුතුවල දී ක්‍රිස්තියානි ආගම පැතිරවීම කෙරෙහි ද අවධානය යොමු කළහ. දහතරවන ලුවී රජු යටතේ කෝල්බෙයා නම් මුදල් ඇමතිගේ මෙහෙය වීම අනුව විදේශවල වෙළෙඳ අධිකාරියක් ගොඩනැංවීමට ප්‍රංශ ජාතිකයෝ උත්සුක වූහ. මව් රටේ අනුග්‍රහය ඇති ව ප්‍රංශ නැගෙනහිර ඉන්දීය වෙළෙඳ සමාගම විසින් ඉන්දියාවේ වෙළෙඳ කටයුතු පණ ගැන්වීමට ක්‍රියාකරන ලදී. එසේ ම බටහිර අප්‍රිකාවේ වහල් වෙළෙඳාම හා වෙනත් වෙළෙඳ කටයුතු අරඹන ලදී.

කැනඩාවේ ද ජනපද පිහිටුවීම ප්‍රංශය විසින් සිදු කර ඇත. මිසිසිපි ගං මෝයේ නිව් ඕලියන්ස් නමැති ස්ථානය පිහිටුවා ගනිමින් ලුසියානා ජනාවාසය සංවිධානය කරන ලදී.

ප්‍රංශයන්ට ද තම මව් රටින් මෙම බල ව්‍යාප්තිය සඳහා අනුග්‍රහය ලැබුණි. ක්‍රි.ව. 1683 කෝල්බෙයාගේ මරණයෙන් පසු ප්‍රංශ බල ව්‍යාප්ත කටයුතුවල පිරිහීමක් දක්නට ලැබේ.

## බෙල්ජියම හා ඩෙන්මාර්කය

වෙළෙඳාම හා තම ආධිපත්‍ය පතුරුවා හැරීමට බෙල්ජියම හා ඩෙන්මාර්කය උත්සාහ ගත්ත ද එය සාර්ථක නො වී ය. බෙල්ජියම විසින් කොංගෝව යටත් කර ගත්ත ද ඩෙන්මාර්කය මෙම ප්‍රයත්නයේ දී සාර්ථක නො වී ය.

## ක්‍රිස්තු ධර්මයේ ව්‍යාප්තිය

විවිධ රටවල් කරා ගිය යුරෝපා ජාතීහු තම ආගම වූ ක්‍රිස්තියානි ධර්මය එම රටවල පැතිර වීම තම යුතුකමක් හා වගකීමක් ලෙස සැලකූහ. යුරෝපය තුළ ක්‍රිස්තියානි සභාව කතෝලික හා රෙපරමාදු වශයෙන් බෙදීයාම නිසා තම තමන් දැරූ මත ඉස්මතු කිරීමේ ප්‍රයත්නයක් ද විය. මෙයින් නව ආගමික උද්යෝගයක් ද ජනිත වූයේ ය. නව පිබිදීමක් ද ඇති විය. ඒ අනුව දහම ව්‍යාප්ත විය.

රෝමානු කතෝලික ආගමට වඩා රෙපරමාදු ආගම වාණිජ අදහස් සමග ශීඝ්‍රයෙන් ව්‍යාප්ත විය. යටත් විජිත පිහිට වූ සෑම යුරෝපීය ජාතියක් ම තම ආගම යටත් විජිතවල ප්‍රචාරය කිරීමට උපරිම අයුරින් කටයුතු කර ඇත. ආගම පැතිරවීමේ ප්‍රධාන මාධ්‍යය ලෙස අධ්‍යාපනය යොදගත් බව පෙනේ. සමහර විට කිතුණු දහම පිළිගත් අයට නිල තනතුරු ප්‍රදානය හා ආර්ථික වාසි සැලසීම ද සිදු විය.

### සාරාංශය

- යුරෝපා බල ව්‍යාප්තිය ඇති වීමට වෙළෙඳාම, ජාතික රාජ්‍ය බිහිවීම ආගම ප්‍රචාරය යන කරුණු පසුබිම් විය.
- මුලින් ම දේශ ගවේෂණ කටයුතුවලට පෙළඹුණේ ස්පාඤ්ඤය සහ පෘතුගාලයයි.
- 17 වන සියවස වන විට ප්‍රංශය, ඕලන්දය, එංගලන්තය යුරෝපා බල ව්‍යාප්තියේ කැපී පෙනෙන බලවතුන් විය.
- බෙල්ජියම හා ඩෙන්මාර්කය ගවේෂණ කටයුතු සඳහා යොමු වුව ද එම රටවල උත්සාහය සාර්ථක නො වී ය.
- යුරෝපා බල ව්‍යාප්තිය සමග රෝමානු කතෝලික හා රෙපරමාදු ආගම් ලොව පුරා ව්‍යාප්ත විය.

### අභ්‍යාස

1. යුරෝපා ජාතීන් තම බලය ලෝකයේ රටවල ව්‍යාප්ත කිරීමේ අරමුණු දෙකක් නම් කරන්න.
2. බ්‍රිතාන්‍ය, ප්‍රංශය යන රටවලට අයත් ව තිබූ යටත් විජිත දෙක බැගින් නම් කරන්න.

### ක්‍රියාකාරකම

- **බ්‍රිතාන්‍ය, ප්‍රංශය, ඕලන්දය යන රටවල් සතු ව තිබූ යටත් විජිත 2 බැගින් ලෝක සිතියමක ලකුණු කොට නම් කරන්න.**